සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

நலன்புரி நன்மைகள் சபை

# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

Ministry of Finance, Economic Stabilaization & National Policies

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය / உமது இல / Your No | |
| දිනය / திகதி / Date | 07. 10. 2022 | | |

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

**<u>සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් තෝරාගැනීම -2022</u>**

**<u>පවරන ලද රාජකාරී කටයුතු ඇතැම් නිලධාරීන් විසින් කාර්යක්ෂමව හා අනලස්ව ඉටු නොකිරීම</u>**

01. 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ විධිවිධාන අනුව උක්ත වැඩසටහන මුලු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර තිබේ.

02. ඒ අනුව පනතේ විධිවිධාන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩල තීරණ අංක WBB/2020/16/BP/04 යටතේ ඔබට සහ සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්ට අවශ්‍ය බලතල මගේ අංක WBB/General/2022 හා 2022.08.22 දිනැති ලිපියෙන් පවරා තිබේ. එසේ ඔබ වෙත පැවරූ බලතල අනුව ඔබ යටතේ සේවය කරන ඕනෑම රජයේ නිලධාරියෙකු ලවා අවශ්‍ය කාර්යයන් ඉටුකර ගත හැකිය.

03. මා අමතන ලද සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරී සංගමයේ ගරු සභාපතිගේ 2022.09.13 දිනැති ලිපිය මඟින් සුබසාධක ප්‍රතිලාභ පනත, එහි නීතිමය රාමුව හා එහි සඳහන් සහනාධාර ලබාදීමේ නිර්ණායක පිළිබඳ පූර්ණ දැනුවත් බවක් ලබා ගැනීම උදෙසා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා සාකච්ඡාවක් ඉල්ලා සිටින ලදී. ඒ අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් මා 2022.09.16 දින අදාළ වෘත්තීය සමිති නියෝජිතයන් සමඟ සාකච්ඡාවක් පවත්වා මෙම සමස්ත වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ඔවුන් තුළ වඩා නිවැරදි හා පැහැදිලි අවබෝධයක් ඇති කිරීමට කටයුතු කළ අතර මෙම වැඩසටහන සාර්ථකව හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ නොමඳ සහායද ඉල්ලා සිටින ලදී.

04. කෙසේ වෙතත් මට හා තවත් අයටද පිටපත් සහිතව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ ලේකම් ඇමතූ සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරී සංගමයේ ගරු සභාපතිගේ 2022.09.21 දිනැති ලිපිය අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය ද සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණෙන තුරු සුබසාධක ප්‍රතිලාභ පනතට අනුව සිදුකරනු ලබන සුබසාධක ප්‍රතිලාභ අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ කටයුතු වලින් සමෘද්ධි නිලධාරීන් තාවකාලිකව ඉවත් වන බව දන්වා සිටින ලදී.

සිව අංක 02 - (04)

05. එමෙන්ම සමෘද්ධි සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ මගේ සමාංක හා 04.10.2022 දිනැති ලිපිය මඟින් මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා සමෘද්ධි නිලධාරින්ගෙන් ලැබිය යුතු රාජකාරීමය සහාය නිසි ලෙස ලබාදෙන මෙන් ඉල්ලා සිටි අතර ඒ අනුව සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා තවත් අය ඇමතූ සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DSD/HO/SS/14/16 සමීක්ෂණ හා 2022.09.14 හා 2022010.05 දිනැති ලිපිය මඟින් සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් තෝරාගැනීම - 2022 වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදෙන ලෙසට ඔවුන්ට උපදෙස් දී ඇත.

06. මේ අතරතුර ඇතැම් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලිඛිතවද ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන්ට වාචිකවද මෙම වැඩසටහන යටතේ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සිය නිර්දේශයන් සමඟ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයෙන් මිදී කටයුතු කිරීමට අවස්ථාව සලසා දෙන ලෙසට ඇතැම් ක්ෂේත්‍ර නිලධාරීන් ඉල්ලා ඇති බව අප වෙත දැනගැනීමට ලැබී ඇත.

07. ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ සාමාන්‍ය හැසිරීම යටතේ ඇති නියමයන් අනුව රජයේ නිලධාරියෙකුගේ සේවය ලබාගැනීමට රජයට අවශ්‍ය වන සෑම විටකදී මෙන්ම සෑම වේලාවකදීම ඔහු රජයට පූර්ණ පක්ෂපාතිත්වය ඇතිව කටයුතු කළ යුතුය.

08. එමෙන්ම යම් නිලධාරියෙකු ලවා ඉටුකරගැනීම මැනවැයි රජයට හැඟීයන ඕනෑම රාජකාරියක් ඉටු කරන ලෙස නියම කරනු ලැබූ විට එම නිලධාරියා විසින් එම රාජකාරිය කාර්යක්ෂමව හා අනලස්ව ඉටු කළ යුතුය.

09. මෙම තත්ත්වය තුළදී තවදුරටත් යම් නිලධාරියෙකු මෙම ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී එයට බාධා වන ලෙස සිය රාජකාරිය පැහැර හරින්නේ නම් එම නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධව සලකා බැලීම සඳහා ඒ බව අදාළ විනය බලධාරීන් වෙත වාර්තා කළ යුතු බවට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය තීරණය කර අතර ඒ බව මෙම ලිපිය මඟින් ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි.

බී. විජයරත්න
සභාපති / කොමසාරිස්
O/C

පිටපත් -

ලේකම් - ජනාධිපති ලේකම් කාර්යාලය
ලේකම් - අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
සියළු දිසාපතිවරුන් වෙත
අධ්‍යක්ෂ ජනරාල් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තුමේන්තුව
ලේකම් - කාන්තා, ළමා හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය

} කාරු.දැ.ගැ.ස.

Sec. Ministry of Finance - Hand Over
Other Ministries - Send e-mails